# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120
ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO – 1732/ 2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024
දිනය / திகதி / Date – 20/11/2024 පැය 0650

**මාධ්‍ය නිවේදනය**

**මිනුවන්ගොඩ ප්‍රදේශයේදී සිදු වූ මුදල් සොරකමට අදාළ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.11.18 වන දින උදෑසන කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ දී මුදල් ආරක්ෂිතව ප්‍රවාහනය කරනු ලබන පුද්ගලික ආයතනයක රියදුරු වශයෙන් කටයුතු කළ පුද්ගලයෙකු රුපියල් කෝටි 07 ½ ක පමණ මුදලක් සොරකම් කර පලා යාමේ සිද්ධිය සම්බන්ධයෙන් ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය හා මිනුවන්ගොඩ පොලිසිය මගින් වැඩිදුර විමර්ශන කටයුතු ආරම්භ කර තිබුණි.

ඒ අනුව ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරින්ට ලද තොරතුරකට අනුව **2024.11.19 වන දින දහවල් කාලයේ ගම්පහ පොලිස් වසමේ කඩුවන්ගහ ප්‍රදේශයේදී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 420 ක් සමඟ පුද්ගලයෙකු අත්අඩංගුවට** ගෙන සිදුකළ වැඩිදුර විමර්ශනයේදී ඉහත සොරකමට අදාල රුපියල් 31,515,291/= (තුන්කෝටි පහළොස් ලක්ෂ පහළොස් දහස් දෙසිය අනූ එකක්) ක මුදලක් සැකකරු සන්තකයේ තිබී සොයා ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන තම්මිට, මාකවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය හා මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**